**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත**

**மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்**

**Department of Education - North Central Province**

**අවසාන වාර පරීක්ෂණය - 2022**

**නර්තනය**

| ශ්‍රේණිය |
|---|
| 8 |

පාසලේ නම :- ..........................................................................................

ඇතුළත්වීමේ අංකය :- ................................................ කාලය : පැය 2 1/2 යි

## නර්තනය I

❖ එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ප්‍රශ්න 20 සඳහා ලකුණු 40 යි.

❖ ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. උඩරට ආධුනික නර්තන ශිල්පියෙකු මූලිකවම උගත යුතු සරඹ වර්ග වනුයේ,
(i) 12 කි (ii) 24 කි (iii) 2 කි (iv) 8 කි

02. සත්ත්ව චරිත නිරූපණයේ දී වඩාත් වැදගත් වන්නේ,
(i) අවකාශ භාවිතය (ii) අංග, ප්‍රත්‍යාංග, උපාංග
(iii) සත්ත්ව චර්යා රටා (iv) තාලානුකූල චලන

03. ඇසළ පෙරහැරට සහභාගි වූ සියලු දෙනාගේ වස් දොස් දුරුවීම සඳහා පවත්වන ශාන්තිකර්මය වනුයේ,
(i) දෙවොල් මඩුව (ii) කොහොඹා කංකාරිය
(iii) පහන් මඩුව (iv) වලියක් මංගල්‍ය

04. නලඟන රූප දක්නට හැකි වන ස්ථානයක් නොවන්නේ,
(i) ගනේගොඩ විහාරය (ii) ගඩලාදෙණිය විහාර ආලින්දයේ පාදනම
(iii) මුල්කිරිගල (iv) මිහින්තලේ කණ්ඨක චෛත්‍ය

05. S. පණිභාරත මහතා විසින් වේදිකාගත කළ නැටුමකි.
(i) කුළු (ii) ගොයම් (iii) මෝල්ගස් (iv) පතුරු

❖ ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු හිස්තැන් මත ලියන්න.

06. දේශීය කැටයම් කලාවේ ගොප්කොළ යොදා ගනිමින් කරනු ලබන සැරසිලි අතර ................................................ සුවිශේෂී සැරසිල්ලකි.

07. ''දීකිරි දීකිරි ....'' යන ගීතය ගායනා කරනු ලබන්නේ ................................................ නාට්‍යයේ දීය.

08. 'භය' නමැති ස්ථායි භාවය නිරූපණයේ දී ................................................ රසය ප්‍රදර්ශනය වේ.

09. උඩරට සම්ප්‍රදායේ 7 වන පා සරඹ පදය ................................................ අඩිය නමින් හැඳින්වේ.

10. නර්තනයේදී ශරීරාංග කොටස්කර දැක්වීමේදී නළල, කම්මුල, ඇස, නාසය, නිකට, ඇහිබැම ................................................ කොටසට අයත් වේ.

❖ **ප්‍රශ්න අංක 11 - 15 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

11. ''සූරිය කුල ඇති හිරු දෙවියන්නේ .........'' මෙම කවිය අයත් වන ගායනා විශේෂය කුමක්ද? ..............................................

12. වෙරොඩි වන්නම නර්තනය කරනු ලබන තාල රූපය ලියා දක්වන්න. ....................................................................................

13. සුළු මහ දෙතිතට අයත් බෙර පදයක් ලියන්න. ....................................................................................................................

14. දෙවොල් මඩු ශාන්ති කර්මයේ දක්නට ලැබෙන නාට්‍යමය පෙළපාලියක් නම් කරන්න. ........................................................

15. කේ.එස්. ප්‍රනාන්දු ගුරුතුමා විසින් නිර්මාණය කරන ලද නර්තන අංගයක් ලියා දක්වන්න. ..................................................

❖ **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා හරිනම් (✓) ලකුණද වැරදි නම් (✗) ලකුණද යොදන්න.**

16. සෑම පා සරඹයක් අවසානයේ ම හමාර පදය නැටීම සිදු කරයි. ( )

17. අලංකාර මාත්‍රා නිර්මාණයේ දී අවකාශය මනාව භාවිතා වේ. ( )

18. මූලික බීජාක්ෂර වාදනයේ දී බෙරයේ වම් ඇසේ ගැටිය අසළට ඇඟිලි අගින් ගැසීමෙන් 'නං' අක්ෂරය උපදියි. ( )

19. ප්‍රස්ථාරකරණය යනු බෙර පද කවි, කස්තිරම් ප්‍රායෝගිකව භාවිතා කරන ආකාරය ලියා දැක්වීමයි. ( )

20. නවරාත්‍රී උත්සවයේ දී නිර්මාණය කරන සැරසිලි අතර නිවෙස්වල නිර්මාණය කරන තට්ටු 9 කින් යුතු සැරසිල්ල 'කොලු' නමින් හැඳින්වේ. ( )

## II කොටස

- ❖ **එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් ප්‍රශ්න පහක් සඳහා ලකුණු 60 කි.**
- ❖ **පහත සඳහන් ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01. I. 9 වන පාසරඹ පදය ලියන්න. (ල. 02)

II. දෑල සරඹයට අයත් කස්තිරම ලියන්න. (ල. 04)

III. ආධුනික නර්තන ශිල්පීන්ට දණ්ඩි සරඹ අභ්‍යාස කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 3 ක් ලියන්න. (ල. 06)

02. I. පහතරට බෙරයෙන් වාදනය කරන සතර බීජාක්ෂර ලියා දක්වන්න. (ල. 02)

II. පහතරට බෙරය වාදනය කරනු ලබන අවස්ථා 4 ක් ලියන්න. (ල. 04)

III. දෙවොල් මඩු ශාන්ති කර්මයේ දී වාදනය කරනු ලබන ප්‍රධාන බෙරයෙහි රූප සටහනක් ඇඳ කොටස් 5 ක් නම් කරන්න. (ල. 06)

03. I. ප්‍රස්ථාරකරණයේ දී දැනගත යුතු විධික්‍රම 2 ක් නම් කරන්න (ල. 02)

II. ඔබ දන්නා පතුරු කවියක් ලියන්න (ල. 04)

III. මාත්‍රා 3 තාලයට සවරන් කවියක් ප්‍රස්තාර කර දක්වන්න (ල. 06)

04. I. ගොප්ගෙඩිය භාවිතයට ගන්නා අවස්ථා නම් කරන්න (ල. 02)

II. ගොප්ගෙඩිය නිර්මාණය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපකරණ ලියා දක්වන්න (ල. 04)

III. ගොප් ගෙඩිය නිර්මාණය කරන ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 06)

05. I. වේගයෙන් භ්‍රමණය වන නලඟනකගේ රූපයක් හමු වීඇති බවට සාධකයක් හමුවන ස්ථානය ලියා දක්වන්න. (ල. 02)

II. නර්තන කලාව හා සම්බන්ධ මූලාශ්‍රයක් ලෙස සැලකෙන ''රූකම්'' වර්ග කර දන්වන්න (ල. 04)

III. අතීතය වාද්‍ය භාණ්ඩ භාවිතා කළ බවට තොරතුරු දැක්වෙන සාධක 2 ක් විස්තර කරන්න. (ල. 06)

06. I. භරත නාට්‍ය සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ 2 ක් ලියන්න. (ල. 02)

II. මෙම නර්තනය සඳහා භාවිතා කරන සංගීත සම්ප්‍රදාය හා වාද්‍ය භාණ්ඩ 3 ක් ලියා දක්වන්න (ල. 04)

III. භරත නාට්‍යම් උගන්වනු ලබන ආයතනය හා එහි ප්‍රවර්ධනය සඳහා දායක වූ ශිල්පීන් 4 දෙනෙකු නම් කරන්න. (ල. 06)

07. පහත සඳහන් මාතෘකා 3 ක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

I. දළදා පෙරහැර

II. නවරාත්‍රී උත්සවය

III. නම්‍යතා අභ්‍යාස

IV. දොවොල් මඩු ශාන්ති කර්මය

V. වෛරොඩි වන්නම. (ල 3 x 4)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න